නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් - සමාජ මාධ්‍ය නියමයන් සහ කොන්දේසි

කරුණාකර නේෂන්ස් ට්‍රස්ට් බැංකු සමාජ මාධ්‍ය නියමයන් සහකොන්දේසි සැළකිල්ලෙන් යුතුව කියවා බලන්න. මෙම ලේඛනය මගින් නීත්‍යානුකූල, ගෞරවාන්විත සහ ආචාර සම්පන්න ආකාරයකින් බැංකුවේ සමාජ මාධ්‍ය අඩවි භාවිත කිරීම සඳහා නියමයන් සහ කොන්දේසි (රීති) විස්තර කරනු ලබයි. අපගේ සමාජ මාධ්‍ය අඩවි වෙත ඕනෑම තොරතුරක් (ලිඛිත තොරතුරක්, ඡායාරූප, වීඩියෝ, උපදවසි ඇතුලත් වන්නා වූ නමුත් ඒවාට සීමා නොවන තොරතුරු) භාවිත කිරීම හෝ ඉදිරිපත් කිරීම මගින් ඔබ විසින් මෙම රීති කියවා අවබෝධ කරගෙන පිළිගෙන එය අනුගමනය කිරීමට එකග වූ බවට එකග වන්නේය.

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. වන අප (යම් අවස්ථාවලදී ,බැංකුව, වශයෙන් හඳුන්වනු ලබන) ගනු-දෙනුකරුවන් වෙත දැනුම්දීමට, සහාය වීමට සහ නිරත වීමට ශ්‍රී ලංකාවේ යම් සමාජ මාධ්‍ය අඩවිවල නාලිකා, පිටු සහ ගිණුම් පවත්වාගෙන යනු ලබයි. අන්‍යාකාරයකට සඳහන් නොවන්නේ නම් මේවා ශ්‍රී ලංකාවේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් අදහස් කරනු ලබන අතර, ශ්‍රී ලංකාවේ භාවිත කිරීම සඳහා අරමුණු කරනු ලබයි.

බැංකුව පිළිබඳව මෙම නාලිකාවල සිදුකරනු ලබන අදහස් දැක්වීම් සහ යෝජනා අප අධීක්ෂණය කර වාර්තාගත කරනු ලබන අතර ඒ අනුව අපගේ සේවාවන් අපහට දියුණු කරගත හැකිය.

අපගේ සමාජ මාධ්‍ය වෙබ්අඩවි භාවිත කරන ඔබ විසින් හෝ වෙනත් ඕනෑම අයෙකු විසින් යෝජනා කළ ඕනෑම කරුණක/තොරතුරක අන්තර්ගතය හෝ නිරවද්‍යතාව සම්බන්ධයෙන් ඔබ වෙත හෝ ඕනෑම තුන්වන පාර්ශවයක් වෙත බැංකුවට වගකීමක් හෝ බැඳී සිටීමක් නොමැත.

අපගේ සමාජ මාධ්‍ය අඩවිවල ඕනෑම පුද්ගලයෙකු විසින් ප්‍රකාශ කරනු ලබන මතවාදයන් එම තැනැත්තාගේ මතවාදයන් වන අතර, එමගින් බැංකුවේ මතවාදයන් කිසිඳු අයුරකින් පෙන්නුම් කිරීමක් නොකරයි.

බැංකුව විසින් භාවිත කරන සමාජ මාධ්‍ය අඩවිවල භාවිත කිරීමේ නියමයන් සහ ප්‍රතිපත්ති (උදාහරණ - ට්විටර්, ලින්කෙඩින්, ෆේස්බුක්, යූටියිබ් සහ ඉන්ස්ටර්ග්‍රෑම්) ද එම සමාජ මාධ්‍ය අඩවිවල අපගේ නාලිකා සහ පිටු ඔබගේ භාවිත කිරීම අදාල වන අතර, එම භාවිත කිරීමේ කොන්දේසි සහ ප්‍රතිපත්ති මෙන්ම මෙම රීති ද ඔබ විසින් අනුගමනය කරනු ලබන බවට ඔබ සහතික කළයුතු වන්නේය. එම සමාජ මාධ්‍ය අඩවි ඔබගේ භාවිත කිරීම හෝ දර්ශනයකිරීමට හෝ ඒවායේ නියමයන්, කොන්දේසි සහ ප්‍රතිපත්ති වලට අණුකූලව කටයුතු කිරීමට ඔබගේ අපොහොසත්වීම ආශ්‍රිත කිසිඳු වගකීමක් අප ප්‍රතික්ෂේප කරන්නෙමු.

මෙම අඩවියෙහි අන්තර්ගතය සහ තොරතුරු, තොරතුරුමය කාර්යන් සඳහා පමණක් වන අතර බැංකුවේ ව්‍යාපාර වස්තු, සුරැකුම්පත් හෝ වෙනත් මූල්‍ය ලියවිලි, නිෂ්පාදනයක් හෝ සේවාවක් මිලදී ගැනීම සඳහා අර්පණයක් හෝ ආයාචනයක් ලෙසට අරමුණු කරනු නොලබයි. බැංකුව විසින් තම සමාජ මාධ්‍ය අඩවි හරහා කිසිඳු ආයෝජන, බදු හෝ වෙනත් වෘත්තීමය උපදෙස් ලබාදීමක් සිදු නොකරයි. මෙම අඩවිය සම්බන්ධ ඔබ සහ බැංකුව අතර වන ඕනෑම සන්නිවේදනයක් මගින් ගනුදෙනුකරුවෙක් වශයෙන් ඔබ අප සමග ඇති වියහැකි කිසිඳු ගිවිසුම් කිසිවක් හෝ වෙනස් කිරීමක්, මාරු කිරීමක් හෝ අහිබවා යාමක් නො-වන්නේයග

අපගේ සමාජ මාධ්‍ය අඩවි භාවිතා කිරීමේදී,

සන්ධර්භයෙන් බැහැර තොරතුරු ගෙනහැර දැක්වීමක් නොකරන බවට සහ තොරතුරෙහි ප්‍රභවය වශයෙන් මුල් කතෘ වෙනුවෙන් ස්තුතියක් ඇතුලත් කරනු ලබන බවටත්,

ඔබ විසින් අපගේ සමාජ මාධ්‍ය අඩවිවල හුවමාරුකරගනු ලබන අන්තර්ගතය පාලනය කරනු ලබන සියලු අදාල දේශීය, විදේශීය සහ ජාත්‍යන්තර නීතිවලට අනුකූලව කටයුතු කරනු ලබන බවටත්,

ඕනෑම අයෙකුගේ පෞද්ගලිකත්වය සම්බන්ධයෙන් අපහාසාත්මක, නීති විරෝධී, අසභ්‍ය, අප්‍රසන්න, වෛරී සහගත, නින්දා සහගත, කුපිත කරවන, තර්ජනාත්මක, ආක්‍රමණශීලී හෝ අන්‍යාකාරයෙන් පිළිකුල් කටයුතු නොවන බවටත්,

ජාතිය, ලිංගිකත්වය, ආගම, ජාතිකත්වය, ආබාධ තත්ත්වය, ආගම හෝ විශ්වාසය, ලිංගික හැඩගැසුම, මානසිකව විරුද්ධ ලිංගයට නැඹුරු වූ තැනැත්තෙකු වීම හෝ වයස යන හේතු මත වෙන්කොට සැළකීම ප්‍රවර්ධනය නොකරනු ලබන බවටත්,

කතෘ අයිතිය, නිර්මාණ අයිතිය, පරිගනක දත්ත ගබඩා අයිතිය, පේටන්ට් බලපත්‍ර, වෙළඳ ලකුණු, සදාචාර හෝ රගපාන්නාගේ අයිතිය හෝ ඕනෑම වෙනත් තුන්වන පාර්ශ්ව අයිතිවාසිකම් ඇතුළුව ඕනෑම බුද්ධිමය දේපල අයිතිවාසිකම් කඩ කිරීමක් නොකරනු ලබන බවටත්,

වෙනත් කිසිඳු තැනැත්තෙකු වෙත හිරිහැර කිරීම, අවුල් කිරීම, බිය වැද්දීම හෝ පීඩාව ඇති කිරීම නොකරන බවටත්,

පුද්ගලයන්ට හෝ පරිගනක වලට හෝ පද්ධතීන්ට හානියක් හෝ අනර්තයක් සිදුවිය හැකි උපදෙසක් හෝ උපදේශයක් අඩංගු වන අන්තර්ගතයක්/තොරතුරුක් යෝජනා නොකරන බවටත්,

කිසිඳු නීති විරෝධී හෝ අපරාධමය ක්‍රියාවක් සිදු කිරීමට කිසිඳු අයෙකු දිරිමත් නොකරනු ලබන බවට හෝ කිසිඳු නීති විරෝධී හෝ අපරාධමය ක්‍රියාවකට සමාව ලබා නොදෙනු ඇති බවටත්,

ඔබගේ අන්තර්ගතය/තොරතුරු බැංකුවෙන් (හෝ එහි සමූහ ව්‍යාපාරයේ ඕනෑම සමාගමකින්) නිකුත් වන බවට හැගවීමක් ලබා නොදීමට, මෙය එයට අදාල කරුණ නොවන්නේ නම් හෝ කිසිඳු පුද්ගලයෙකු වෙනුවට පෙනී සිටීමක් හෝ වෙනත් පුද්ගලයෙකු සමග ඔබගේ අනන්‍යතාව හෝ අනුබැදීම අවනිදේශනය කිරීමක් හෝ නොකරනු ඇති බවටත්,

කිසිඳු වෙළඳ ප්‍රචාරණයක් අඩංගු වන අන්තර්ගතයක්/තොරතුරක් යෝජනා නොකරනු ලබන බවටත් ය.

යම් අවස්ථාවලදී අප විසින් අපගේ සමාජ මාධ්‍ය අඩවිවල නිරත වන භාවිතකරුවන්ව ස්වයංක්‍රීයව ආපසු නිරත වීමක් සිදුකළ හැකිය. එවැනි ආපසු නිරත වීමක් තුළින් එය අනුමත කිරීමක් ස්ථාපනය නොවන අතර, එය අපට අයිති නොවන හෝ අන්‍යාකාරයෙන් ට්විටර්, ලින්කෙඩින්, ෆේස්බුක් හෝ ඉන්ස්ටර්ග්‍රෑම් ඇතුලුව නමුත් ඒවාට සීමා නොවී ඕනෑම අන්තර්ජාල වේදිකාවක් මත තොරතුරු හුවමාරුකරගනු ලබන හෝ ඕනෑම සමාජ මාධ්‍ය අඩවිවල නිරත වන ගිණුම්වල ඇතුලත් කළ පණිවිඩයක්/අන්තර්ගතය නැවත බැලීමකට හෝ හුවමාරුකර ගැනීමකට අදාල වන්නේය.

සමාජ මාධ්‍ය අඩවි, ඒවායෙහි නිෂ්පාදනයන් හෝ සේවාවන් හෝ 3 වන පාර්ශවයන් හෝ අනෙකුත් භාවිත කරන්නන් විසින් ඒවාට ඇතුලත් කරනු ලබන කිසිදු තොරතුරු අප අනුමතකිරීමක් නොකරන්නෙමු.

ඔබ සමාජ මාධ්‍ය හරහා බැංකු සමග නිරත වන අවස්ථාවේදි ඔබගේ පෞද්ගලික දත්ත බැංකුවේ පාලනයෙන් බැහැර එම සමාජ මාධ්‍ය අඩවි සර්වරයන්හි ගබඩා වියහැකිය. ඔබගේ පෞද්ගලික දත්තයන් අප භාවිතා කරනු ලබන්නේ කුමන ආකාරයෙන්ද යන්න සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර අපගේ පෞද්ගලික තාව පිළිබඳ ප්‍රතිපත්තිය බලන්න.

අපගේ සමාජ මාධ්‍ය අඩවිවල ඔබ විසින් ඇතුලත් කරන ඕනෑම තොරතුරක් පොදු මහජනතාව විසින් ප්‍රවේශය ලබා එය කියවිය හැකිය. එමනිසා පෞද්ගලික ගිණුම් තොරතුරු හෝ මූල්‍ය වැඩපිළිවෙළවල් සාකච්ඡා කිරීමට එය සුදුසු ස්ථානයක් නොවන්නේය. බැංකුව විසින් සමාජ මාධ්‍ය අඩවි හරහා පෞද්ගලික ගිණුම් හෝ ආරක්ෂක තොරතුරු හුවමාරුකරගැනීමට ඔබගෙන් ඉල්ලා නොසිටිනු ඇති අතර, එම නාලිකාවන්හි එවැනි තොරතුරු ඔබ විසින් ඇතුලත් නොකළ යුත්තේය.

අප විසින් අපගේ සමාජ මාධ්‍ය අඩවියට ඇතුලත් කරනු ලබන අන්තර්ගතය ඔබ වෙනස් නොකරන්නේ නම් සහ එම අන්තර්ගතයේ ප්‍රභවය වශයෙන් ඔබ විසින් අපව ගෙනහැර දක්වනු ලබන්නේ නම් ඔබට එය හවුලේ පරිහරණය කර අදහස් දැක්වීම සිදුකළ හැකිය. අපගේ සමාජ මාධ්‍ය අඩවිවල අප ඇතුලත් කරනු ලබන සියලු මුල් අන්තර්ගතය බැංකුවේ කතෘ අයිතිය වන අතර ඕනෑම බැංකු වෙළඳ ලකුණු, ලාංජන හෝ සැළසුම් නිර්මාණ බැංකුවෙහි බුද්ධිමය දේපල වන්නේය.

ඔබ විසින් අපගේ සමාජ මාධ්‍ය අඩවි වලට ඇතුලත් කළ හෝ එකතු කළ ඕනෑම තොරතුරක් මගින් තුන්වන පාර්ශවයකට අපහාසාත්මක වන බවට හෝ ඔවුන්ගේ බුද්ධිමය දේපල අයිතිවාසිකම් සම්බන්ධයෙන් හෝ ඔවුන්ගේ පෞද්ගලිකත්වයට අදාල අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වන බවට කියාපානු ලබන එවැනි ඕනෑම තුන්වන පාර්ශවයක් වෙත ඔබගේ අනන්‍යතාව හෙළි කිරීමට ද අපහට අයිතිය තිබේ. අලාභ ඇති වීමේ හැකියාව පිළිබඳව බැංකුව දැනුවත් කරනු ලබන්නේ වුවද නොවූවද අපගේ ඕනෑම සමාජ මාධ්‍ය අඩවි හෝ සම්බන්ධිත අඩවියක් භාවිත කිරීමේදී පුද්ගලික අනර්ථය, මරණය, ප්‍රමාදය හෝ භාවිත කිරීමට නොහැකි වීම මත වන වගකීම ඇතුළුව අපගේ සමාජ මාධ්‍ය අඩවි හෝ සම්බන්ධිත අඩවියක් භාවිත කිරීම හෝ අපගේ සමාජ මාධ්‍ය අඩවිවල ඕනෑම අත්හිටුවීමක් සංශෝධනයක් හෝ අවංලගු කිරීමක්, තාක්ෂණික ගැටළු, ලැබුණු හෝ එකතු කළ සැළකිරීම් තුළින් හෝ ඊට සම්බන්ධිතව උද්ගත වන ලාභ අහිමිවීම, ආදේශිත සේවා ප්‍රසම්පාදන පිරිවැය හෝ අවස්ථාව අහිමිවීම ඇතුළුව සීමාවකින් තොරව ඕනෑම සෘජු, වක්‍ර, විශේෂිත, දණ්ඩනීය, ආනුශාංගික හෝ වක්‍ර අලාභ හෝ පාඩු සම්බන්ධයෙන් බැංකුව හෝ අපගේ සමාජ මාධ්‍ය අඩවි සඳහා තොරතුරු නිර්මාණය කිරීම නිෂ්පාදනය හෝ සැපයීමේදී සම්බන්ධ වන ඕනෑම තුන්වන පාර්ශවයක් හෝ ඉහත කරුණු කිසිවක් හෝ සම්බන්ධයෙන් සම්බන්ධ වන නිළධාරීන්, අධ්‍යක්ෂවරුන්, සේවකයින් හෝ නියෝජිතයින් හෝ වගකිව යුතු නොවන්නේය. මෙම සීමා කිරීමට බලපෑ හැකි ඕනෑම වෛරස්, දත්ත හෝ හානිදායක කේත සම්ප්‍රේෂණය වීම, අපගේ සමාජ මාධ්‍ය අඩවිවල ලිපි ගොනු සහ භාවිතා කරන්නාගේ බ්‍රවුසරය හො වෙනත් මාධය ප්‍රවේශ වැඩ සටහන් අතර ඕනෑම අසංගතභාවයක් හෝ ඕනෑම විද්‍යුත් හෝ දුරකථන උපකරණයක සන්නිවේදන හෝ සම්බන්ධිත මාර්ගවල ඕනෑම බිඳ වැටීමක් අනවසර ප්‍රවේශය, සොරකම, ක්‍රියාකරු දෝෂ හෝ ආනුපාතික බලපෑම යන කරුණු ඇතුලත් වන අතර ඒවාට සීමා නොවන්නේය.

අපගේ සමාජ මාධ්‍ය අඩවි වෙත අඛණ්ඩ, නිර්බාධිත හෝ සුරක්ෂිත ප්‍රවේශය සඳහා අප ඇපවීමක් නොකරන අතර අපහට ඇපවීමක් සිදුකළ නොහැකිය.

සම්බන්ධිත අඩවි මගින් සපයනු ලබන අන්තර්ගතය, නිරවද්‍යතාව, ප්‍රකාශිත මතයන් සහ අනෙකුත් ඇඳි (බසබනි) බැංකුව විසින් කිසිසේත් විමර්ශනය කිරීමක්, සසඳා බලා නිවැරදි කිරීමක්, අධීක්ෂණය කිරීමක් හෝ අනුමත කිරීමක් හෝ කරනු නොලබයි.

අපගේ සමාජ මාධ්‍ය අඩවිවල හෝ සම්බන්ධිත අඩවියක ප්‍රසිද්ධ කළ තොරතුරු, මෘදුකාංග, නිෂ්පාදනයන් සහ සේවා පිළිබඳ විස්තරවල නිවැරදි නොවන කරුණු හෝ යතුරුලියන දෝෂයන් ඇතුලත් වියහැකි අතර එවැනි නිවැරදි නොවනතාවන් හෝ දෝෂයන් වලට සම්බන්ධ වීමට කිසිඳු වගකීමක් අප විශේෂිතවම බැහැර කරන්නෙමු. අපගේ සමාජ මාධ්‍ය අඩවිවල සහ සම්බන්ධිත අඩවිවල තොරතුරු වලට කලින් කලට වෙනස්කම් සිදුකරනු ලබයි. බැංකුවට ඕනෑම අවස්ථාවකදී අපගේ සමජ මාධ්‍ය අඩවි වලට වැඩිදියුණු කිරීම් හෝ වෙනස්කම් සිදුකළ හැකිය.

අපගේ සමාජ මාධ්‍ය අඩවි වයස අවුරුදු 18 ක හෝ ඊට වැඩි පුද්ගලයන් විසින් භාවිත කරනු ලබනු ඇති බවට අරමුණු කරනු ලබයි. එමනිසා බාලවයස්කරුවන් විසින් අපගේ සමාජ මාධ්‍ය අඩවි භාවිත කිරීමට ප්‍රථමයෙන් ඔවුන්ගේ දෙමව්පියන්ගේ හෝ භාරකරුවන්ගේ අවසරය ලබාගත යුත්තේය. අපගේ සමාජ මාධ්‍ය අඩවි භාවිත කිරීමට තම දරුවන්ට ඉඩ ලබාදෙන දෙමව්පියන්/භාරකරුවන් විසින් ප්‍රථමයෙන් තම දරුවන් සමග අන්තර්ජාල ආරක්ෂාව පිළිබඳව සාකච්චා කර සමාජ මාධ්‍ය අඩවිවල ඕනෑම භාවිත කිරීමක් අධීක්ෂණය කිරීමට උත්සාහ දරණ ලෙසට අප නිර්දේශ කරන්නෙමු. බාලවයස්කරුවන්ට සමාජ මාධ්‍ය ආරක්ෂාකාරී ලෙස භාවිත කරන්නේ කුමන ආකාරයෙන්ද යන්න සම්බන්ධයෙන් සහ මෙම රීති වලට අනුකූලව කටයුතු කරනු ලබන ආකාරයක් පිළිබඳව මාර්ගෝපදේශයක් ද ලබාදිය යුතු වන්නේය.

අපගේ සමාජ මාධ්‍ය අඩවි වෙත ඕනෑම තොරතුරු ඉදිරිපත් කිරීම මගින් එම තොරතුරු භාවිත කිරීමට අනන්‍ය නොවූ අවිච්ඡින්න බලපත්‍රයක් අප වෙත ලබාදීමට සහ ඔබගේ සදාචාර අයිතීන් අත්හැරීමට ඔබ එකග වන්නේය. ඕනෑම ආකෘතියකින් සහ මාධ්‍යයකින් එම තොරතුරු නිදහසේ භාවිත කිරීමට, සංස්කරණය කිරීමට, වෙනස් කිරීමට, නැවත ඉදිරිපත් කිරීමට, ප්‍රසිද්ධ කිරීමට සහ/හෝ බෙදා හැරීමට අප අයිතිය ලබනු ඇත. මෙම බලපත්‍රය නොමිලයේ සහ අවිච්ඡින්න වනු ඇති අතර, අතුරු බලපත්‍ර සම්බන්ධයෙන් ද හැකියාව ලබනු ඇත.

ඔබ ඇතුලත් කරනු ලබන තොරතුර මගින් වෙනත් කිසිඳු පුද්ගලයෙකුගේ කිසිඳු කතෘ අයිතියක්, දත්ත පද්ධති අයිතියක් හෝ වෙළඳ ලකුණක් උල්ලංඝනය නොවන බවට ඔබ සහතික කළයුතු වන්නේය. ඔබගේ තොරතුරු අප වෙත ඉදිරිපත් කිරීම මගින් ඉහත විස්තර කරන ලද අනන්‍ය නොවූ කතෘ අයිති බලපත්‍රය අප වෙත ලබාදීමට ඔබට අයිතිය තිබෙන බවට ඔබ අවසරය දෙනු ලබයි.

එවැනි බලපත්‍රයක් අප වෙත ලබාදීමට ඔබට හැකියාවක් නොමැත්තේ නම් අපගේ සමාජ මාධ්‍ය අඩවි වෙත කරුණාකර කිසිඳු තොරතුරක් ඇතුලත් නොකරන්න. අපගේ මතයට අනුව කිසියම් හෝ පුද්ගලයෙකු මෙම රීති උල්ලංඝනය කරමින් අපගේ සමාජ මාධ්‍ය අඩවි භාවිත කිරීම සිදු කරනු ලබන්නේ නම් පූර්ව ආවරණ කිරීමකින් තොරව අපගේ සමාජ මාධ්‍ය අඩවි වෙත ඕනෑම දායකත්වයකට අදාල ප්‍රවේශය ඉවත් කිරීමට හෝ දුර්වල කිරීමට සහ ඔවුන්ගේ ප්‍රවේශය පිළිබඳ කොන්දේසිය අවසන් කිරීමට, අත්හිටුවීමට හෝ වෙනස් කිරීමට අප අයිතිය රඳවා තබා ගන්නෙමු. මෙම රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ඕනෑම පුද්ගලයෙකුට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට හෝ අපහට සාධාරණ ලෙස සුදුසු යැයි පෙනී යන පරිදි යම් වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට ඇති අයිතිය ද අප රඳවා තබා ගන්නෙමු.

ඕනෑම අවස්ථාවකදී මෙම රීති අප විසින් සංශෝධනය කළහැකිය. අප විසින් කරනු ලබන ඕනෑම වෙනස්කම් ඔබ මත නෛතිකව බන්ධනීය වන හෙයින් සහ වෙනස් කරනු ලැබූ දින සිට ඒවා ඔබ වෙත අදාල වන හෙයින් එවැනි ඕනෑම වෙනස්කම් පිළිබඳව දැනුවත් වීමට විටින් විට ඔබ විසින් මෙම පිටුව පරීක්ෂා කරනු ඇති බවට අපේක්ෂා කරනු ලබයි. වෙනස්කම සිදු කිරීමෙන් අනතුරුව අපගේ සමාජ මාධ්‍ය කිසිවක් හෝ භාවිත කරනු ලබන්නේ නම් රීතිවලට කරන ලද එවැනි ඕනෑම වෙනස්කම ඔබ බාරගෙන ඊට අනුකූලව කටයුතු කිරීමට ඔබ එකග වන්නේය.

තවද, අපගේ සමාජ මාධ්‍ය අඩවි වලට ඇතුලත් වීම මගින්, නැරඹීම, ප්‍රවේශ වීම මගින්, ඉන් අයිතමයන් බාගත කිරීම මගින්, බ්‍රවුසින් හෝ අන්‍යාකාරයට භාවිත කිරීම මගින් මෙම රීති හෝ ඔබගේ ඉදිරිපත් කිරීම් කිසිවක් හෝ ඕනෑම උල්ලංඝනය කිරීමක් තුළින් උද්ගත වන්නා වූ ඕනෑම සහ සියලු හිමිකම්පෑම්, පාඩු, පිරිවැය, අලාභ, වගකීම් සහ පිරිවැය සහ වියදම් (සාධාරණ නීතීඥවරුන්ගේ ගාස්තු සහ පිරිවැය ඇතුළුව) වලින් සහ ඒවාට, බැංකුව, එහි නියෝජිතයන්, සේවා සපයන්නන් සහ ඔවුන්ගේ අදාල මව් ආයතන සහ ඒවායේ සහ ඔවුන්ගේ පාලිත ආයතන, අනුබද්ධ ආයතන, අනුප්‍රාප්තිකයන්, බලපත්‍රලාභීන් සහ අනුබැඳීම් සහ ඔවුන් එක් එක් තැනැත්තාගේ අධ්‍යක්ෂවරුන්, නිළධාරීන්, නියෝජිතයන්, අයිති දරන්නන් සහ සේවකයින් හානිපූර්ණය කිරීමට, ආරක්ෂා කිරීමට සහ හානියකින් තොරව තැබීමට ඔබ එකග වන්නේය.

මෙම රීති ශ්‍රී ලංකාවේ නීති මගින් පාලනය වන සහ ඊට අනුකූලව ස්ථාපනය විය යුතු අතර, මෙම රීති, ඒවායේ විෂයගත කරුණු හෝ තොරතුරු තුළින් හෝ ඒ සම්බන්ධයෙන් උද්ගත වන ඕනෑම ආරවුලක් හෝ හිමිකම්පෑමක් විසදීමට ශ්‍රී ලංකාවේ අධිකරණ වලට අනන්‍ය අධිකරණ බලය තිබෙන බවට ඔබ අවලංගු කළ නොහැකි ලෙස පිළිගනු ලබයි.

මෙම රීතිවල ඕනෑම කොටසක් නීති විරෝධී, බලරහිත හෝ ඕනෑම හේතුවක් මත බලාත්මක කළ නොහැකි බවට පෙනී යන්නේ නම් එවිට එම කොටස වෙන්කළ හැකි ලෙසට පෙනී යනු ඇති අතර, ඉතිරි කොටස්වල වලංගුතාව සහ බලාත්මක කළහැකි භාවයට ඉන් බලපෑමක් නොවනු ඇත.

අලෙවිකරණ සන්නිවේදනයන්ගෙන් බැහැර වීම

ඔබ වෙත සෘජුව තැපැල් මාර්ගයෙන් සහ සමාජ මාධ්‍යයෙන් ඔබ වෙත වෙළඳ ප්‍රචාරණ එවීම අප විසින් නතර කිරීමට ඕනෑම විටක ඔබ කැමති වන්නේ නම් අංක 0114711411 ඇමතීම මගින් අපගේ සබඳතා මධ්‍යස්ථානයෙහි නියෝජිතයෙකු කරුණාකර සම්බන්ධ කර ගන්න.  අප විසින් ඉන් අනතුරුව ඔබ වෙත කිසිදු වියදමකින් තොරව, දින 30 ක් ඇතුලතදී හෝ අප විසින් තීරණය කරනු ලබන පරිදි යම් වෙනත් කාලපරිච්ඡේදයක් ඇතුලතදී ඔබගේ ඉල්ලීම මත කටයුතු කරනු ඇති අතර, සෘජු තැපැල් මාර්ගයෙන් අනාගත සෘජු අලෙවිකරණ ප්‍රවර්ධනයන්හිදී සහ සමාජ මාධ්‍ය වෙළඳ ප්‍රචාරණ කටයුතු වලදී ඔබව ඇතුලත් කර නොගන්නා බවට සහතික වන්නෙමු.

සමාජ මාධ්‍ය පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය

යෝජනා කාල රාමු

අපගේ නිළ සමාජ මාධ්‍ය වේදිකාවන්හි මතු කරනු ලබන සියලු විමසීම් සහ ප්‍රශ්න වලට කඩිනම් ප්‍රතිචාර සැපයීමට අප කැපවී සිටිමු.

මෙම කටයුත්තෙහි කොටසක් වශයෙන් ඔබගේ විමසීම් හෝ ගැටළු ලැබුණු දින සිට සාධාරණ කාලයක් ඇතුලත ඒ සඳහා භාර ගැනීම හෝ පිළිතුරු සැපයීම අප විසින් සිදුකරනු ඇත.  ඕනෑම ආරවුලක් උද්ගත වුවහොත් විසඳීමේ ක්‍රියාවලිය තුළින් බැංකුවේ සම්මත කටයුතු කිරීමේ කාලයට අනුකූල වනු ඇත.